# බ්‍රාහ්මණ සූත්‍රය

ඒ දවස්වල භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ වැඩ සිටියේ සැවැත් නුවර අනේපිඬු සිටුතුමා විසින් කරවන ලද ජේතවනාරාමයේ යි. ඒදා පින්වත් ආනන්ද ස්වාමීන් වහන්සේ පෙරවරු කාලයේ සිවුරු හැඳ පොරොවාගෙන පාත්‍ර සිවුරු අරගෙන සැවැත්නුවරට පිණ්ඩපාතය පිණිස වැඩම කළා.

ඒ අවස්ථාවේ දී සම්පූර්ණයෙන් ම සුදු පාට වෙළඹුන් යෙදූ රථයකින් සැවැත් නුවරින් නික්මිලා යන ජාණුස්සෝනි බ්‍රාහ්මණයා ව පින්වත් ආනන්ද ස්වාමීන් වහන්සේට දැක ගන්නට ලැබුණා.

ඒ රථයට සුදු පාටින් සැරසූ සුදු ම පාටින් යුත් අශ්වයින් ව තමයි යොදල තිබුනේ. රථය ත් සුදු පාට යි, අනෙකුත් උපකරණ ත් සුදු පාට යි. රැහැන් පට ත් සුදු පාට යි. කෙවිට ත් සුදු යි. කුඩය ත් සුදු යි. නළල්පට ත් සුදු යි. වස්ත්‍ර ත් සුදු යි. පා වහනුත් සුදු යි. සුදු පාට ම වට අත්තකින් පවන් සළනවා.

මේ රථය දැකපු මිනිස්සු මේ විදියට ඒ ගැන කථා වෙන්න පටන් ගත්තා. "පින්වත්නි, මේක නම් ඒකාන්තයෙන් ම ශ්‍රේෂ්ඨ යානාවක් (රථයක්). ඒකාන්තයෙන් ම බ්‍රහ්මයා ගේ රථය වගේ රථයක් (බ්‍රහ්මයානයක්)."

ඉන්පසු ව පින්වත් ආනන්ද ස්වාමීන් වහන්සේ සැවැත්නුවර පිණ්ඩපාතය පිණිස වැඩම කරලා පිණ්ඩපාතය වැළඳීමෙන් පසු ව භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ වෙත පැමිණුනා. පැමිණිලා භාග්‍යවතුන් වහන්සේට ආදරයෙන් වන්දනා කරල එකත් පසෙකින් හිඳ ගත්තා. එකත් පසෙකින් හිඳ ගත් ආයුෂ්මත් ආනන්ද ස්වාමීන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙහෙම පැවසුවා.

"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මම අද පෙරවරු කාලයේ සිවුරු හැඳ පොරවාගෙන පාත්‍ර සිවුරු අරගෙන සැවැත්නුවරට පිණ්ඩපාතය පිණිස වැඩම කළා.

ඒ අවස්ථාවේ දී සම්පූර්ණයෙන් ම සුදු පාට වෙළඹුන් යෙදූ රථයකින් සැවැත් නුවරින් පිටත්වෙන ජාණුස්සෝනි බ්‍රාහ්මණයා ව මට දැක ගන්නට ලැබුණා. ඒ රථයට සුදු පාටින් සැරසූ සුදු ම පාටින් යුත් අශ්වයින් ව තමයි යොදල තිබුනේ. රථය ත් සුදු පාට යි, අනෙකුත් උපකරණ ත් සුදු පාට යි. රැහැන් පට ත් සුදු පාට යි. කෙවිට ත් සුදු යි. කුඩය ත් සුදු යි. නළල්පට ත් සුදු යි. වස්ත්‍ර ත් සුදු යි. පා වහනුත් සුදු යි. සුදු පාට ම වට අත්තකින් පවන් සළනවා.

මේ රථය දැකපු මිනිස්සු මේ විදියට කියනන්න පටන් ගත්තා. 'පින්වත්නි, මේක නම් ඒකාන්තයෙන් ම ශ්‍රේෂ්ඨ යානාවක් (රථයක්). ඒකාන්තයෙන් ම බ්‍රහ්මයා ගේ රථය වගේ රථයක් (බ්‍රහ්මයානයක්).'

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මේ ධර්ම විනය තුළ ත් බ්‍රහ්මයානයක් පණවන්නට

හැකියාවක් තිබෙනවා ද?"

"හැකි යි ආනන්ද" කියා භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"පින්වත් ආනන්ද, බ්‍රහ්මයානය කියන්නෙ ත්, ධර්ම යානය කියන්නෙ ත්, අනුත්තර වූ සංග්‍රාම විජය (අති ශ්‍රේෂ්ඨ වූ යුධ ජයග්‍රහණය) කියන්නෙ ත් මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයට ම යි.

පින්වත් ආනන්ද, වඩන ලද, බහුල වශයෙන් වඩන ලද සම්මා දිට්ඨිය රාගය දුරු කිරීම කෙළවර කරගෙන යි පවතින්නේ. ද්වේශය දුරුකිරීම කෙළවර කරගෙන යි පවතින්නේ. මෝහය දුරු කිරීම කෙළවර කරගෙන යි පවතින්නේ.

පින්වත් ආනන්ද, වඩන ලද, බහුල වශයෙන් වඩන ලද සම්මා සංකල්පය රාගය දුරු කිරීම කෙළවර කරගෙන යි පවතින්නේ. ද්වේශය දුරුකිරීම කෙළවර කරගෙන යි පවතින්නේ. මෝහය දුරු කිරීම කෙළවර කරගෙන යි පවතින්නේ.

පින්වත් ආනන්ද, වඩන ලද, බහුල වශයෙන් වඩන ලද සම්මා වාචා රාගය දුරු කිරීම කෙළවර කරගෙන යි පවතින්නේ. ද්වේශය දුරුකිරීම කෙළවර කරගෙන යි පවතින්නේ. මෝහය දුරු කිරීම කෙළවර කරගෙන යි පවතින්නේ.

පින්වත් ආනන්ද, වඩන ලද, බහුල වශයෙන් වඩන ලද සම්මා කම්මන්තය රාගය දුරු කිරීම කෙළවර කරගෙන යි පවතින්නේ. ද්වේශය දුරුකිරීම කෙළවර කරගෙන යි පවතින්නේ. මෝහය දුරු කිරීම කෙළවර කරගෙන යි පවතින්නේ.

පින්වත් ආනන්ද, වඩන ලද, බහුල වශයෙන් වඩන ලද සම්මා ආජීවය රාගය දුරු කිරීම කෙළවර කරගෙන යි පවතින්නේ. ද්වේශය දුරුකිරීම කෙළවර කරගෙන යි පවතින්නේ. මෝහය දුරු කිරීම කෙළවර කරගෙන යි පවතින්නේ.

පින්වත් ආනන්ද, වඩන ලද, බහුල වශයෙන් වඩන ලද සම්මා වායාම රාගය දුරු කිරීම කෙළවර කරගෙන යි පවතින්නේ. ද්වේශය දුරුකිරීම කෙළවර කරගෙන යි පවතින්නේ. මෝහය දුරු කිරීම කෙළවර කරගෙන යි පවතින්නේ.

පින්වත් ආනන්ද, වඩන ලද, බහුල වශයෙන් වඩන ලද සම්මා සතිය රාගය දුරු කිරීම කෙළවර කරගෙන යි පවතින්නේ. ද්වේශය දුරුකිරීම කෙළවර කරගෙන යි පවතින්නේ. මෝහය දුරු කිරීම කෙළවර කරගෙන යි පවතින්නේ.

පින්වත් ආනන්ද, වඩන ලද, බහුල වශයෙන් වඩන ලද සම්මා සමාධිය රාගය දුරු කිරීම කෙළවර කරගෙන යි පවතින්නේ. ද්වේශය දුරුකිරීම කෙළවර කරගෙන යි පවතින්නේ. මෝහය දුරු කිරීම කෙළවර කරගෙන යි පවතින්නේ.

පින්වත් ආනන්ද බ්‍රහ්ම යානය කියන්නෙ ත්, ධර්ම යානය කියන්නෙ ත්, අනුත්තර සංග්‍රාම විජය කියන්නේ ත් මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයට ම බව මේ කරුණු වලිනු ත්

තේරුම් ගතයුතු යි.”

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. මෙසේ වදාළ සුගත වූ ශාස්තෘන් වහන්සේ අනතුරුව මෙසේ ද වදාළ සේක.

01. *යස්ස සද්ධා ච පඤ්ඤා ච - ධම්මා යුත්තා සදා ධුරං,*
*හිරි ඊසා මනෝ යොත්තං - සති ආරක්ඛසාරථී*

මේ ආර්ය මාර්ගය නම් වූ යානයේ, ශ්‍රද්ධාව ත් ප්‍රඥාව ත් කියන ධර්මතා හැම වෙලේ ම ක්‍රියාවේ යොදවල යි තිබෙන්නේ. ලැජ්ජාව තමයි මේ යානයේ රිය හිස. මනස තමයි මේ යානයේ රැහැන. මේ රථයේ ආරක්ෂක රියදුරා වෙන්නේ සිහිය යි.

02. *රථෝ සීලපරික්ඛාරෝ ඣානක්ඛෝ චක්කවීරියෝ,*
*උපේඛා ධුරසමාධි - අනිච්ඡා පරිවාරණං,*

ආර්ය අෂ්ඨාංගික මාර්ගය නැමති මේ රථය අලංකාර කරල තිබෙන්නේ ශීලයෙන්. මේ රථයේ රෝද සම්බන්ධ කරන අලවංගුව වෙන්නේ ධ්‍යාන යි. වීරිය කියන්නේ මේ රථයේ රෝද වලට. උපේක්ෂාවෙන් තමයි මේ රථයේ ක්‍රියාව සමබර කරල තිබෙන්නේ. අලෝභයෙන් තමයි මේ රථය ආවරණය කරල තිබෙන්නේ.

03. *අව්‍යාපාදෝ අවිහිංසා විවේකෝ යස්ස ආවුධං*
*තිතික්ඛා චම්මසන්නාහෝ යෝගක්ඛේමාය වත්තති.*

තරහ නැති බව ත්, හිංසා නැති බව ත්, විවේකය ත් තමයි මේ රථයේ තිබෙන ආයුධ. ඉවසීම තමයි යුධ සැට්ටය වෙන්නේ. මේ රථය නිවන පිණිස යි පවතින්නේ.

04. *ඒතදත්තනි සම්භූතං බ්‍රහ්මයානං අනුත්තරං*
*නීයන්ති ධීරා ලෝකම්හා අඤ්ඤදත්වු ජයං ජයන්ති.*

යම් කිසි කෙනෙක් ගේ ජීවිතය තුළ මේ අනුත්තර වූ බ්‍රහ්මයානය හට ගත්තොත්, ඒ ප්‍රඥාවන්ත පිරිස ඒකාන්තයෙන් ම මාර යුද්ධය දිනමින් මේ ලෝකයෙන් නික්මිලා යනවා.

භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ මේ උතුම් දේශනය වදාළා. පින්වත් ආනන්ද ස්වාමීන් වහන්සේ ඉතා සතුටට පත් වුනා. මේ උතුම් දේශනය සාධුකාර නංවමින් සතුටින් පිළිගත්තා.

සාදු ! සාදු !! සාදු !!!

<u>පසු සටහන.</u>

මේ ලෝකයේ නොයෙකුත් යුද්ධ තිබෙනවා. ඒ හැම යුද්ධයක් ම බාහිර ත් එක්ක කරන යුද්ධ. ඒ වගේ ම ඒ යුද්ධ වලට යොදා ගන්න යුද්ධ රථ ත් තිබෙනවා. නමුත් ඒ කිසි දෙයක් අනුත්තර වෙන්නෙ නැහැ. ඒ දේවල් බොහොම ළාමක යි.

බුදු රජාණන් වහන්සේ අපිට අනුත්තර වූ සංග්‍රාමයක් පෙන්වා වදාළා. ඒ තමයි අප ගේ අභ්‍යන්තර සතුරන් සමග කරන සංග්‍රාමය. ඒ සංග්‍රාමයේ දී සිදු කරන්නේ රාග ද්වේශ මෝහ කියන සතුරන් ව විනාශ කරන එක යි.

ඉතින් මේ සංග්‍රාමය උදෙසා අනුත්තර වූ යුද්ධ රථයක් අවශ්‍ය යි. ආර්ය අෂ්ඨාංගික මාර්ගය තමයි අන්න ඒ උතුම් රථය වෙන්නෙ. ඒ ශ්‍රේෂ්ඨ යානයෙන් කෙළෙස් සතුරන් සමග සිදු කරන මාර යුද්ධය දිනා දෙනවා. ඒ සඳහා වෙන මාර්ගයක් නැහැ.

භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ හරීම සුන්දර විදියට මේ සූත්‍ර දේශනාවෙන් ඒ අනුත්තර වූ සංග්‍රාම විජය ගැන අපිට කියල දෙනවා. බලන්න අප ගේ ශ්‍රාස්තෘන් වහන්සේ කෙතරම් නම් අසිරිමත් ද?

ඒ අසිරිමත් ශාස්තෘන් වහන්සේට, ඒ ශ්‍රී සද්ධර්මයට, ඒ මඟ අනුගමනය කරන ආර්ය සඟ රුවනට අප ගේ නමස්කාරය වේවා !!!

**ඔබ සැමට තෙරුවන් සරණ යි !**



## DhammaMedicine

Namo Buddhaya !!!
This is the only path;
there is none other for
the purification of insight !

Visit this Google Group
Click2Comment | Discussions |



**Drink Dhamma medicine to get rid of all stresses**